A

# නිවේදනය

පසුගිය දින කිහිපය පුරාවට අප රටේ සෑම ප්‍රදේශයකම පාහේ ඇද හැලුනු ධාරානිපාත වර්ෂාව හේතුවෙන් මේ වන විට ඇති වී තිබෙන බරපතළ ගංවතුර තත්ත්වය, නායයෑම්, පස් කඳු කඩා වැටීම්, මහාමාර්ග හානියට පත්වීම් හා වෙනත් විවිධ වූ ස්වභාවික ආපදාවන් හේතුවෙන් සමස්ත දිවයින පුරාම ලක්ෂ සංඛ්‍යාත ජනතාවකට තමන් පදිංචිව සිටි තැන් පවා අහිමිව අවතැන්වී දැඩි දුෂ්කරතාවයන්ට හා සාමාන්‍ය ජන ජීවිතයේ නොසන්සුන් තත්ත්වයකට පත්වී සිටින බව ඉතාමත් සංවේදීව හා සංවේගයෙන් සිහිපත් කරමි.

මේ වන විට ඇති වී තිබෙන බරපතළ ආපදා තත්ත්වය හේතුවෙන් පුද්ගල ජීවිත අහිමිවීම්, දේපළ විනාශවීම් ඇතුළු දරුණු අර්බුදකාරී ගැටලුවලට මුහුණ පෑමට සිදුවී ඇති අතර මෙම අසරණ වූ ජනතාවගේ අපහසුතාවයන් පිළිබඳ සමස්ත පාර්ලිමේන්තුවේම දැඩි අවධානය යොමු වී ඇති බවත්, මෙම බරපතළ ව්‍යසන තත්ත්වය පිළිබඳව සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දැඩි කනගාටුව හා සංවේගය පළ කරනු ලබන බවත්, දැනුම්දීමට කැමැත්තෙමි.

ශ්‍රී ලාංකික ජනතාව විසින් මුහුණපා ඇති මෙම ගැටලුකාරී තත්ත්වයන් හා අපහසුතාවයන් හැකි විගස නිමාවට පත්වී ඔවුන් සැම දෙනාගේ සාමාන්‍ය ජන ජීවිතය කඩිනමින් යථා තත්ත්වයට පත්වනු ඇතැයි ඉත සිතින් යුතුව ප්‍රාර්ථනා කරමි.